# ත්‍රිපිටක ධර්ම දායාදය

## ජාතික උරුමයක් වූ වගයි



**"ත්‍රිපිටක ධර්ම දායාදය ජාතික උරුමයක් වූ වගයි"**

යනුවෙන් ප්‍රකාශයට පත් වන
මේ පුස්තිකාව
උදාර ලෝක උරුමයක් වූ
ථෙරවාද ත්‍රිපිටකය
අති පාරිශුද්ධ
ජාතික උරුමයක් සේ
මාතලේ ඓතිහාසික
අලුවිහාරයේ දී
2019-01-05 වන දින
නිලවශයෙන්
ප්‍රකාශයට පත් කිරීමේ
පුණ්‍ය මහොත්සවය වෙනුවෙන්
ජනාධිපති මාධ්‍ය අංශය මඟින්
සම්පාදනය කරන ලදී.



1-CM 28971

| | |
|---|---|
| පරි. අංක | 6719 |
| වර්ග අංකය. | 294 |
| දිනය | |



## ශාසනික පරිහානියක් වළක්වාගැනීමේ පියවරක්.

තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො

මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළති. වැසුනේ නොබබළති. වළගම්බා මහරජු සමයෙහි ලක්දිව පැවති බැමිණිටියා මහා සාගතය වැනි දුර්භාග්‍ය සම්පන්න බිහිසුණු ව්‍යසනයකට මුහුණ දී වුවද සිරිලක වැඩ සිටි ධර්ම ශාස්ත්‍රයෙහි නිපුණා වූ මහා ප්‍රාඥ වූ මහතෙරුන් වහන්සේලා විසින් කට පාඩමින් පවත්වාගෙන ආ නිවැරදි පාරිශුද්ධ බුද්ධ භාෂිතය ඇතුළත් ත්‍රිපිටක පාලිය හා අටවිකතා සංගායනා කොට ප්‍රථම වරට මාතලේ අළුලෙන දී ලේඛනගත කරන ලදී. එමගින් පිරිසිදු ථෙරවාදී ත්‍රිපිටක බුද්ධ භාෂිතය සුරක්ෂිත වී ආරක්ෂා විය.

ශ්‍රී බුද්ධ වර්ෂ 2500 වැන්නේ එළඹි ශ්‍රී සම්බුද්ධ ජයන්තිය මුල් කොට ත්‍රිපිටක පාලිය පරිවර්තනයක් වශයෙන් බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව ශ්‍රී ලංකා ආණ්ඩුව මගින් ප්‍රකාශයට පත්කරන ලදී. එසේ තිබියදී මෑත භාගයේ සිට අර්ථ විකෘති කරන ලද ත්‍රිපිටක පරිවර්තන රැසක් සමාජගත වෙමින් පවතී. එම පරිවර්තන තුළින් විකෘති කරන ලද අර්ථ විරහිත ස්වමතයන් ද ප්‍රකාශයට පමුණුවන බව දක්නට ලැබේ. ධර්ම ශාස්ත්‍ර විරෝධී එම ක්‍රියාමාර්ග පිරිසිදු ථෙරවාදී සසුනේ චිරපැවැත්ම හා සුරක්ෂිත භාවයට බලවත් හානියකි. එමගින් අනාගතයෙහි ඇති විය හැකි ශාසනික පරිහානිය මගහරවා ලීම සඳහා සම්බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීමට ප්‍රතිඥා දී ඇති රජයට ඇත්තේ බලවත් යුතුකමකි.

ඒ සඳහා අර්ථදායී ක්‍රියාමාර්ගයක් අනුගමනය කරනු වස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ත්‍රිපිටකය ජාතික උරුමයක් ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ පුණ්‍යෝත්සවයක් මාතලේ අලුවිහාරයේ දී පැවැත්වීමට සංවිධානය කිරීම අගය කොට සලකන අතර, එහි සියලු කටයුතු ත්‍රිවිධ රත්නයේ හා ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ආශිර්වාදයෙන් සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ශාසනාලයෙන් ආශිංසනය කරමිහ.

ඒ වගත් මෙසේම,
මහනුවර උපෝෂිත, පුෂ්පාරාම විහාරද්වයාධිපති
අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන
මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මල්වතු මහා විහාර පාර්ශවයේ මහානායක ස්ථවිර
මල්වතු මහා විහාරය, මහනුවර



2-CM 28971



## <u>මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශුභාශිර්වාද පණිවුඩය</u>

"යො ඛො ආනන්ද මයා ධම්මො ච විනයො ච
දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා"
(දීඝනිකාය - මහාපරිනිබ්බාණ සූත්‍රය)

පුරා පන්සාලිස් වසක් ලෝක සත්වයා වෙත පතළ මහාකරුණාවෙන් දේශිත උතුම් වූ ශ්‍රී සද්ධර්මය තමන් වහන්සේගේ ඇවෑමෙන් ශාස්තෘන් වහන්සේ වන බව තථාගතයන් වහන්සේම පෙන්වා දී වදාළහ. ඒ උතුම් ශ්‍රී සද්ධර්මය වසර දෙදහස් හයසියක් පුරා පාරිශුද්ධ ලෙසින් පවතිනුයේ බුදුරජාණන් වහන්සේ ධරමාන අවධියේ දී ම ධර්මයේ සුරක්ෂිතභාවය විෂයෙහි යොදන ලද විධිමත් ක්‍රියාමාර්ග නිසාත්, සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ශ්‍රාවකයන් වහන්සේලා විසින් තම දිවි නොතකා ධර්ම සංරක්ෂණය විෂයෙහි යොදන ලද විධිමත් ක්‍රියාමාර්ග නිසාත් බව ශාසනික ඉතිහාසයෙන් පසක් කොට ගත හැකිය. කලින් කලට ශාසනයටත් ධර්මයටත් ඇත්වූ දුර්දසාපන්න අවස්ථාවන්හි දී ධර්මයේ අත්‍යන්ත පාරිශුද්ධය සුරක්ෂා කිරීමෙහි ලා ලාංකේය භික්ෂුවට හිමිවනුයේ ප්‍රමුඛ ස්ථානයකි.

විනයධර ප්‍රවර උපාලි මහරහතන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරානුගත මහින්ද මහා රහතන්වහන්සේ විසින් අරිට්ඨ මහරහතන්වහන්සේ ප්‍රමුඛ ලාංකේය භික්ෂූන් වහන්සේලාට උරුම කොට දෙන ලද ශ්‍රී මුඛ භාෂිතය එවක් පටන් ප්‍රවේණිගත උරුමයක් සේ සලකා තම දිවි දෙවැනි කොට රක්ෂණය කිරීමට මහාවිහාරිය භික්ෂූන් වහන්සේලා අප්‍රමාණ වෙහෙසක් දැරූහ. රට තුළ ඇතිවූ ව්‍යසනකාරී අවස්ථාවන්වල දී මෙන්ම දුර්මතධාරීන්ගෙන් ධර්මයට ඇතිවන විපත්තිකර තත්ත්වයන්හි දී ද නිසි පිළියම් යොදා උන්වහන්සේලා විසින් ධර්මය ආරක්ෂා කරන්නට යෙදුණි. වළගම්බා රාජ්‍ය අවධියේ දොළොස් වසරක් පුරා පැවති "බැමිණිතියාසාය" නම් දුර්භික්ෂ අවස්ථාවේ එවක වැඩ සිටි මහා යතිවරයන්වහන්සේලා මුඛ පරම්පරාවෙන් හදාළ ධර්මය, කුසට නිසි අහරක් නොමැතිකමින් ධාරණය කර ගත නොහැකිව විදේශ රටවලට ගොස් එය ආරක්ෂා කරගැනීමටත් ඇතැම් භික්ෂූන් මෙහිම වෙසෙමින් වැල්ලේ ලියමින් එය දූක සේ වාචොද්ග්‍රහණය කරමින් සංරක්ෂණය කරගන්නට ප්‍රයත්න දරන ලදී.

එවන් දුර්දසාපන්න අවස්ථාවක ධර්මයට සිදුවන හානිකර තත්ත්වයන් පසක් කර ගත් එදවස වැඩසිටි මහාවිහාරවාසී ධර්මවිනයධර මහායතිවරයන් වහන්සේලා පන්සිය නමක් දොළොස් වසරක්

පුරා පැවති දුර්භික්ෂය කෙළවර ධර්මය, භාණක පරම්පරානුගතව පවත්වාගෙන යැමේ දී ඇතිවන පුද්ගල අවිනිශ්චිතතාවත් අභයගිරි විහාරවාසීන් ප්‍රමුඛ වෙනත් සම්ප්‍රදායන්ගෙන් ථේරවාදී ත්‍රිපිටකය විෂයෙහිලා උපදවන අභියෝගත් හඳුනා ගෙන එයට නිසි පිළියමක් ලෙස මාතලේ අලු විහාරයට රැස්ව ශ්‍රී මුඛ බුද්ධභාෂිතය ගැබ් කොටගත් උතුම් වූ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළහ. එකී උත්තුංග කාර්යය නිසා සිංහල ද්වීපය ථේරවාදී බෞද්ධ ලෝකයේ ඉමහත් ගෞරවාදරයට පාත්‍ර වූ බව ද ප්‍රකට කරුණකි.

කලින් කලට ධර්මය විෂයෙහි යම් යම් අභියෝග ජනිත වූ අවස්ථාවල තත්කාලීනව වැඩ සිටි යතිවරයන් වහන්සේලා සේම රාජ්‍ය පාලක පක්ෂයත් ධර්මය නිසි අයුරින් ආරක්ෂා කරන්නට වෙර දැරූ බව පූර්වෝක්තය. අද්‍යතන යුගය වනවිටද විශ්විය වශයෙන් තාක්ෂණික දියුණුවත් සමඟ ධර්මයේ පාරිශුද්ධභාවය සහ සංරක්ෂණය කෙරෙහි යම් යම් අභියෝග එල්ලවෙමින් පවතී. එවන් වකවානුවක අතිපූජනීය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේත් දැන උගත් ගිහි පැවිදි හැම දෙනාගෙත් ඉල්ලීම පරිදි වියත් මහතෙරුන් වහන්සේලාගෙන් සුසැදි සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය විසින් සංස්කරණය කොට ශ්‍රී ලංකා ජනරජයේ පූර්ණ අනුග්‍රහයෙන් එළිදක්වා ඇති ත්‍රිපිටකය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ගේ බලතල ප්‍රකාරව සුවිශේෂී ජාතික උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම, ධර්මය අනාගතටයත් සුවිශුද්ධව පවත්වා ගෙන යැමට අතිශයින් ශ්‍රේෂ්ඨ සහ කාලෝචිත පියවරක් බව සංතුෂ්ටියෙන් සඳහන් කළ හැකිය.
මාතලේ ආලෝක රජමහා විහාරයේදීම එම මාහැඟි තර්තව්‍යය සිදුකිරීමද, එදවස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සේම ඓතිහාසික සංසිද්ධියක් සේද සැලකිය හැකි අතරම ලෝකවාසී ගිහිපැවිදි හැමදෙනාගේම ප්‍රශංසාව හිමි විය යුතු එම උතුම් සත්ක්‍රියාව සිදුකළ අතිගරු ජනාධිපතිතුමාටත් ගරු බුද්ධශාසන අමාත්‍යතුමන් ඇතුළු ගිහිපැවිදි කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් අපගේ ශුභාශිර්වාද පළ කරනු කැමැත්තෙම්හ.

**චිරං තිට්ඨතු ලෝකස්මිං සම්මා සම්බුද්ධ සාසනං**

ශ්‍රී භයගිරි විජයසුන්දාරාම විහාරදේවයාධිපති,
වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන,
මහාවිහාර වංශික සත්‍යාමෝපාලි මහානිකායේ
මහානායක ස්ථවිරයන් වහන්සේ වම්හ.



## <u>නිර්මල ථේරවාදී ධර්මය ආරක්‍ෂා කරගැනීමට ගත් පියවරකී</u>

සම්මා සම්බුද්ධ දේශිත ත්‍රිපිටක ධර්මය විකෘති කොට දේශනා කරමින් බෞද්ධ ජනතාව නොමඟ යවන අධර්මවාදීන්ගේ මතවාදයන් මැඬලා අවු. 2500 ට ආසන්න කාලයක් ජිවිත පරිත්‍යාග යෙන් මෙරට භික්ෂූන්වහන්සේ ආරක්ෂා කරගත් නිර්මල ථෙරවාදී ධර්මය තවත් චිරාත් කාලයක් ආරක්ෂා කර ගැනීමට මහත් රුකුලක් ලෙස ශ්‍රීමත් ජනාධිපතිතුමන් ප්‍රමුඛ රාජය 2500 සම්බුද්ධ ජයන්තිය නිමිතිකර සම්භාවනීය සංඝපීතෘන් වහන්සේලා විසින් පරිවර්තනය කොට සම්පාදිත සූත්‍ර, විනය, අභිධර්ම දේශනා අන්තර්ගත ථෙරවාදී ත්‍රිපිටකය ජාතික උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට පියවර ගැනීම ගරුතර මහා සංඝරත්නයේ හා බෞද්ධ ජනතාව ගේ ම ප්‍රසාදයට ප්‍රීතියට හේතු වේ.

ධර්මය විකෘතිකරන මිත්‍යාදෘෂ්ටීන්ගෙන් ධර්මය ආරක්ෂා කර ගැනීමට ජනාධිපතිතුමන් විසින් ත්‍රිපිටක ධර්මය ජාතික උරුමයක් ලෙස නම් කිරීම උපකාර වනු ඇත. අධර්මවාදීහු ධර්මය කෙලෙසුවේ අද පමණක් නොවෙති. පෙර රජ දවස නීලපට දර්ශනය වෛතුල්‍යවාදය, වාජිරියවාදය නමින් ඇති වූ ධර්ම විරෝධී විෂබීජයන් බැහැර කොට ථෙරවාදී ධර්මය ආරක්ෂා කර ගැනීමට භික්ෂූන්වහන්සේ ගත් උත්සහායට සහය වෙමින් අපේ රජවරුන් මිථ්‍යාමත පැතිරවූවන්ට රටින් පිටමං කිරීම, පිට හණ තැබීම ආදී දඬුවම්ද පැමිණ වූ බව මහාවංශය නිකාය සංග්‍රහය ආදී ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වේ. දුටුගැමුණු, ගෝඨාභය බුද්ධදාස ආදී රජවරු බුද්ධ ධර්මය රැක ගැනීම තම පරම යුතුකමක් ලෙස සැලකූහ.

අද ත්‍රිපිටක බුද්ධ ධර්මය විකෘති කොට දේශනා පවත්වන, පොත පත ලියන අධර්මවාදීන්ට රජ දවස දඬුවම්දී හෝ ධර්මයට එල්ල වී ඇති මෙම ව්‍යසනය දුරලීමට ද පියවර ගන්නා ලෙස ගරු ජනාධිපතිතුමන් ප්‍රමුඛ රජයෙන් ඉල්ලා සිටිමු.

මෙයට,
ශාසනස්ථිකාමී,
අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය නාපාන පේමසිරි අභිධාන,
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක මහා ස්ථවිර



## <u>ඓතිහාසික සිද්ධියක්</u>

තථාගත බුදුරජාණන්වහන්සේ වදාළ අසූ සාරදහසක් ධර්මස්කන්ධය එක් කොට ත්‍රිපිටකය සකස් වී ඇත. එදා කටපාඩමෙන් ගෙන ආ මේ ධර්මය වළගම්බා රාජ සමයේ දී මාතලේ අලුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කරන ලදහ. ඒ උදාර සත්ක්‍රියාව නිසාම බෞද්ධ ලෝකයෙහි ශ්‍රී ලංකාවට ලැබුණේ උත්කෘෂ්ට ස්ථානයකි. අද දක්වාම ලෝකයෙහි බෞද්ධ කේන්ද්‍රස්ථානය වශයෙන් ලංකාවට තැනක් ලැබී ඇත්තේ මේ නිසාම බව සිහිපත් කළ යුතුය. එය වඩාත් සවිමත් කරවනු සඳහා මාතලේ අලුවිහාරයේ දී මෙම ජනවාරි පස් වැනි දින ශ්‍රීමත් ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත්කිරීමේ මහෝත්සවය පැවැත්වීම බෙහෙවින්ම කාලෝචිතය. එය කියා නිම නොකළ හැකි තරම් අගනා - ඓතිහාසික උත්සවයක් බව නොවලහා කිය යුතුව තිබේ.

නූතන සමයෙහි බුදු දහම විවිධාකාර අයුරින් විග්‍රහ කිරීමට ඇතැම් අය ඉදිරිපත් වී ඇත. එසේ වුවහොත් ඒ විකෘති අදහස් බුදුදහම වශයෙන් අනාගත පරම්පරාවන් පිළිගැනීමට ඉඩ තිබේ. අතිග රු ජනාධිපතිතුමන් විසින් මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු බව දැන උගත් මහා සංඝයා වහන්සේලා සහ ගිහි බෞද්ධ උගතුන් විසින් රජයට දන්වා සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ උදාර සත්කෘත්‍යය ඉටුකරනු දැක්ම බෞද්ධ ලෝකයාට සැනසීමට හේතුවක් වන්නේය. ඇතැම් අය අද තම තමන්ගේ අදහස් ද කවා - පොඩා භාග්‍යවතුන් වහන්සේ, මහ බෝසතාණන් කෙනෙකුන් වශයෙන් අපරිමිත කාලාන්තරයක් පුරා පාරමී දම් නිමකොට ලෝකයාට දේශනා කරන ලද ධර්මය අපිරිසිදු කරමින් ලියන - කියන බවක් අසන්නටත් - දකින්නටත් - කියවීමටත් ජනසමාජයට ඉදිරිපත් කරමින් සිටිති. මේ මහා විනාශ නවතාලීමට ත්‍රිපිටක ධර්මය ජාතික උරුමයක් වශයෙන් රජය විසින් ස්ථාවර කිරීම කිය නොහැකි තරම් වාසනාවකි.

දෙදහස් පන්සිය වසරේ දී එදා රජය විසින් බලංගොඩ ආනන්ද මෛත්‍රීය සංඝ නේතෘන්වහන්සේගේ අනුශාසකත්වයෙන්, පණ්ඩිත ශිරෝමණි ලබුගම ශ්‍රී ලංකානන්ද මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ මහා පඬිවරුන් වහන්සේලා යොමුකරවා, බුද්ධ ජයන්තියට නිකුත් කළ බුරුම ත්‍රිපිටකය ද ඇසුරු කරමින්, "ත්‍රිපිටක ග්‍රන්ථ මාලා" නමින් බුදු දහම මුද්‍රණය කොට තිබේ. එය, එයාකාරයෙන්ම ස්ථාවර කරමින්, ශ්‍රීමත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සහ ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා ප්‍රධාන ලංකා රජය විසින් පිරිසුදු ත්‍රිපිටකය "ජාතික උරුමයක්" බවට පත්කිරීම ඓතිහාසික සිද්ධියක් වශයෙන් අපේ වංශ කථාවල ලියැවෙනු නොඅනුමාන ය. මෙය සිදු නොවුණි නම් අධර්මය, ධර්මය වශයෙන් මේ යන අව්වාරවත් ක්‍රියාදාමයන් නවතාගත නොහැකි වනු ඇත.

"චිරං තිට්ඨතු සද්ධම්මෝ - ලෝකොහෝතු සුඛී සදා"

අග්ගමහාපණ්ඩිත කොටුගොඩ ධම්මාවාස
ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක



## ජාතික වගකීමක්

ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත්කිරීම ප්‍රශස්තය. වර්තමානය වනවිට ත්‍රිපිටකය නිර්වචනය කරන සමහර අය වැරැදි අර්ථකථන යොදමින් ත්‍රිපිටකය නිර්වචනය කරන බව ද දක්නට ලැබේ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත්කිරීමට ගත් උත්සාහය වර්තමානයේ විකෘති මතවාදයන් මගින් ත්‍රිපිටකය විනාශ කිරීමට උත්සාහ දරන්නන්ට ද යහපත් පණිවිඩයක් වන බව මට හැඟේ. සමහර අය ත්‍රිපිටකය නැවැත ලේඛන ගත කරන විට ද වැරැදි අර්ථකථන සපයන බව දක්නට ලැබේ. මෙවැනි ආකාරයට ත්‍රිපිටකයට සිදුකරන හානිය වැලැක්වීමේ හැකියාව ද ත්‍රිපිටකය ජාතික උරුමයක් කිරීමේ කාර්ය මගින් සිදුවේ. ලෝකයේ බෞද්ධ ජනතාවගේ විශ්වාසය අනුව නිර්මල ථේරවාදය අදටත් ශ්‍රී ලංකාවේ පවතියි. නිර්මල ත්‍රිපිටකය සුරක්ෂා කිරීමේ භාරදූර වගකීම උසුලුයේ ද ශ්‍රී ලාංකේය ථේරවාද භික්ෂූන්ය. බුදුරජාණන් වහන්සේ පන්සාලිස් වසක් දේශනා කළ ධර්මය බුද්ධ පරිනිර්වාණයත් සමඟ විවිධ දුර්මත ධාරීන් නිසා පරිහානියට පත්වන බව දුටු මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ථේරීය භික්ෂූන්ගේ සහභාගිත්වයෙන් ප්‍රථම ධර්ම සංගීතිය පවත්වා ධර්මය ආරක්ෂා කළහ. විනය සූත්‍ර අභිධර්මය නමින් ත්‍රිපිකයක් ලෙස ගොඩනැගුණු ධර්මය ආරක්ෂා කිරීමේ භාරදූර වගකීම ද ප්‍රථම ධර්ම සංගීතියෙන් පසුව භික්ෂූන් වහන්සේටම පැවැරිණ. එවක් පටන් අනුරාධපුර යුගයේ වලගම්බා රාජ්‍ය සමය දක්වාම ත්‍රිපිටකයේ සුරක්ෂාව දිවිහිමියෙන් නොනැසෙන සේ කටපාඩමින් ආරක්ෂා කළ භාණක භික්ෂූන් බැමිතිතියා සාය නිසා ත්‍රිපිටකයට වන අනතුර දැක මාතලේ අලුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළහ.

මෙලෙස බොහෝ කැපකිරීම් කොට ආරක්ෂා කළ ත්‍රිපිටකය ඉදිරියටත් පවත්වා ගෙන යෑමට ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත්කිරීම ජාතික වටිනා කමකි. වර්තමානයේ ත්‍රිපිටකය හමුවේ විවිධ අභියෝග පවතින බව අපට ද මැනවින් දක්නට ලැබේ. වර්තමානයේ ත්‍රිපිටකයට එල්ලවන විවිධ අභියෝග පිළිබඳ ජනාධිපතිතුමාගේ අවධානය යොමුවීම මගින් ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත් කිරීමට ගත් ප්‍රශස්ත උත්සාහය බෞද්ධ ජනතාවගේ පැසසුමට භාජනය වීම ද වටී. නිර්මල ත්‍රිපිටකය අදට ද ලෝකයට බෙදා දිය හැක්කේ අපවන් ථේරවාදී බෞද්ධ රටකට පමණි. මෙම උත්තර්තර උදාර කාර්ය වෙනුවෙන් කැපවුණු අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මා ඇතුලු සැමට සුභාශිංසන පිරිනමන අතර උතුම් තුණුරුවන් පිහිට ලැබේවායි පතමි.

කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝ සභාවේ මහානායක
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කුලපති
ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ධර්මවිජයාලෝක මහා විහාරය, රුක්මලේ



## ධර්මානුකූල සමාජයක් උදෙසා

අනුබුදු මිහිඳු මාහිමියන් විසින් අප දේශයට දායාද කරන ලද්දේ මුල් සංගායනා දෙකෙහි දී සම්මත වී, තෙවැනි සංගීතියෙහි දී ද අනුමත වූ පාලි ත්‍රිපිටකය යි. ශ්‍රී ලාංකේය බෞද්ධ සම්ප්‍රදායේ මූලාශ්‍රයන් වනුයේ එකී පාලි ත්‍රිපිටක ග්‍රන්ථ හා ඒවායේ පරිවාර ග්‍රන්ථ වන අට්ඨකතා හා ටීකා යි.

පළමු ධර්ම සංගීතියේ සිට ක්‍රි. ව. පළමු වැනි සියවසේ මාතලේ අලූ ලෙනෙහි දී සිදු වූ ත්‍රිපිටක ග්‍රන්ථාරූඪකරණය දක්වා වූ සියවස් හතරකට වැඩි කාලයක් ත්‍රිපිටක ධර්මය මුඛ පරම්පරාගත ව පවත්වා ගැනුණේ මහ තෙරුන් වහන්සේලා ද උන්වහන්සේලා ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවන් ද විසිනි.

වළගම්බා රජු ගේ දෙවැනි රාජ්‍යප්‍රාප්තියට ආසන්න කාලයක එනම් ක්‍රිස්තු වර්ෂය ආරම්භයේ දී ම ත්‍රිපිටකය ක්‍රමවත් ව ලේඛනගත කිරීමට මෙරට මහා සංඝයාවහන්සේ පළ කළ කෘතහස්ත භාවයත්,විචක්ෂණ භාවයත් විමති සහගත ය. ධාරණයෙන් පවත්වාගෙන ආ ලොව උදාර ධර්ම සාහිත්‍යයික දායාදයක් ලේඛනගත වීමෙන් අනතුරු ව එය ලංකාද්වීපයේ පරිශුද්ධ උරුමයක් ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීමක් ඉතිහාසයේ කිසි කලෙක සිදු විණැ යි කිව නොහැකි ය.

ගරුතර මහා සංඝරත්නයේ උපදෙස් හා අනුශාසනා සහිත ව ඒ පූජනීය උරුමයට නීත්‍යනුකූල භාවයක් හිමි කර දීමට මා රාජ්‍ය නායකයා ලෙස කටයුතු කරන සමයෙහි ම ස්වාධීන පියවරක් ගැනීමට හැකි වීම මහත් සොම්නසට කරුණකි.

මින් පසු ත්‍රිපිටකයේ හරයට බලපාන විකෘති කරණයන්ට අවකාශ නොලැබෙන අතර, බුද්ධභාෂිතයේ වේෂයෙන් එන ජනප්‍රිය අංගයන් පිළිබඳ ව සාවධාන වීමට ද ඉඩ සැලසෙනු ඇත. ශාසන චිරස්ථිතියට හේතු වන්නේ ප්‍රතිපත්තිය බව වටහා ගනිමින්, විනය පිළිබඳ වැඩි අවධානයක් සඳහා මෙමඟින් අනුබල ලැබේ. තව ද පෞද්ගලික ආයතන මඟින් ත්‍රිපිටකය මුද්‍රණය කිරීමේ දී විවිධ දෝෂ සහිත වීම නොවැළැක්විය හැකි හෙයින්, මේ ග්‍රන්ථාවලිය නැවත මුද්‍රණයේ හා ප්‍රකාශනයේ අයිතිය මින් පසු බුද්ධශාසන අමාත්‍යාංශය සතු වේ.

බුද්ධභාෂිතය ස්මෘතියෙන් දරා සිටිමින් අනේක දුක්ඛයන් විඳි අතීත මහාසංඝරත්නයටත්, මේ කාර්යය සඳහා මා දිරිමත් කළ අප ගේ ගෞරවනීය මහා සංඝයා වහන්සේලාටත් මෙහි දී කෘතඥතා පූර්වක ව නමස්කාර කරමි.

බුද්ධ වචනය පිළිබඳ අප්‍රමාණ ගෞරවාදරයෙන් ගනු ලැබූ මේ පියවර හේතු කොටගෙන ධර්මානුකූල

සමාජයක් බිහි වේ වා යි ද ප්‍රාර්ථනය කරමි.


මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය





# ජාතික උරුමයක් වූ ත්‍රිපිටක ධර්ම දායාදය

ශ්‍රී ලාංකේය බෞද්ධ සම්ප්‍රදායයේ මූලාශ්‍ර ග්‍රන්ථ වශයෙන් සැලැකෙනුයේ පාලි ත්‍රිපිටක ග්‍රන්ථ යි. සූත්‍ර, විනය හා අභිධර්ම යන පිටක තුනට අයත් පාලි ග්‍රන්ථ මෙන් ම ඒවායේ පරිවාර ග්‍රන්ථ වන අට්ඨකතා හා ටීකා ද ත්‍රිපිටක ධර්මයට ඇතුළත් වේ.



මේ වූකලි ඇසීමෙන් මතකයෙහි රඳවාගැනීම පිළිබඳ ව ලෝක ඉතිහාසයේ හමු වන පූජනීය උරුමයන් අතුරෙන් ප්‍රමුඛස්ථානයේ ලා සැලැකෙන්නකි. ප්‍රථම ධර්ම සංගායනාවේ සිට ක්‍රි.ව. පළමුවැනි සියවසේ මාතලේ අලු ලෙනෙහි දී සිදු වූ ත්‍රිපිටක ග්‍රන්ථාරූඪකරණය දක්වා මහ තෙරුන් වහන්සේලා ද, උන්වහන්සේලා ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවන් ද එකී ධර්මස්කන්ධය පවත්වා ගන්නා ලද්දේ මුඛපරම්පරාගත ව ය. බුදුන් වහන්සේ ජීවමාන කාලයෙහි, නවංගසත්ථුසාසන,



3-CM 28971

යනුවෙන් කොටස් නවයකට බෙදා තිබුණු බුද්ධ වචනය ප්‍රථම ධර්ම සංගායනාවේ දී විනය, සුත්ත, අභිධර්ම යනුවෙන් පිටක තුනකට වෙන් කර ගැනිණි. පුරා හතළිස් පස් වසක් ධර්ම චාරිකාවෙහි යෙදෙමින් විවිධ ස්ථානයන්හි දී නොඑක් අවස්ථා පාදක කොට උන්වහන්සේ දෙසූ ධර්මය, පන්සියයක් භික්ෂූන් වහන්සේ එක් ව කටපාඩමින් කීම මෙකී ප්‍රථම ධර්ම සංගායනාවේ දී සිදු විය. එතැන් සිට විනය පිටකය මතු ශාසනාරක්ෂාව සඳහා දිවි හිමියෙන් සුරකිමින් පවත්වා ගැනීමේ භාරදූර වගකීම පැවරුණේ උපාලි මහ තෙරුන් වහන්සේට හා උන්වහන්සේ ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය. උපාලි මහා ස්ථවිරයන් විනය පිටකය ධාරණය කොට ගත්තේ බුදුන් වහන්සේ වෙතිනි.



**භාණක තෙරවරු**

සූත්‍ර හා අභිධර්ම පිටක ද ප්‍රථම ධර්ම සංගීතිය අවස්ථාවේ සිට ම ඒ ඒ ආචාර්ය පරම්පරාවන්ට භාර විය. ත්‍රිපිටකයේ එක් එක් කොටස් ආරක්ෂා කිරීමේත් පවත්වාගෙන යෑමේත් වගකීම පැවරුණ භික්ෂූන් වහන්සේලා ප්‍රථම ධර්ම සංගායනාවේ දී "භාණක" නාමයෙන් හැඳින්විණි. මේ අනුව භාණක තෙරවරුන් දීඝ, මජ්ඣිම, සංයුක්ත, අංගුත්තර, ධම්මපද,

මහා ආරියවංශ භාණකයන් ලෙස හැඳින්වුණු අතර පැරැණි සිංහල ශිලාලිපිවල මජ්මබණක, සයුනබණක, උතරබණක, සුතන, පෙළබණක ආදි වශයෙන් භාණකවරුන් නම් කොට තිබේ.

භාණකවරයකු ගේ කාර්යය වූයේ තමා සිත්හි දරාගන්නා ධර්මය පරපුරින් පරපුරට පවත්වාගෙන යෑම ය. ඇසීමෙන් මතකයෙහි රඳවාගැනීම මඟින් බොහෝ ඇසූපිරූ තැන් ඇති භික්ෂුව ත්‍රිපිටකයෙහි තම ස්මෘතියෙහි වඩාත් තිරසර ව පිහිටි අංශයෙහි භාණක තත්ත්වයට පත් විය. මේ අනුව මජ්ක්ධිම නිකායේ පළමු සූත්‍ර පනහ ධාරණය කොටගත් භික්ෂුව මජ්ක්ධිම භාණක නම් විය. ජාතක පොතත්, එහි අටුවාවත්, ධම්මපදයත් කටපාඩමින් දත් භික්ෂූන් වහන්සේ ජාතක භාණක නම් වූහ.

අනුරාධපුර මහා විහාරික භික්ෂූන් වහන්සේ ගේ අධ්‍යාපන ක්‍රමය වූයේ ද ආචාර්යවරයා විසින් පහදා දෙනු ලබන ධර්මය ශ්‍රැතියෙන් හෙවත් ඇසීමෙන් ධාරණය කොට වනපොත් කරමින් පාරම්පරික ව ආරක්ෂා කිරීම ය. මහා විහාරික භික්ෂූන් වහන්සේ ත්‍රිපිටක ධර්මය රැකගත් අයුරු විමසන කල අද ජාතිය සතු ව ඇති මේ මහා උරුමය පිළිබඳ ව ඇතිවන්නේ පෙර නො වූ විරූ ගෞරවාදරයකි. බුද්ධ භාෂිතයේ ආරක්ෂාව මතු මතුත් පවත්වා ගැනීම සඳහා මහා විහාරික භික්ෂූන් බැමිණිතියාසාය පැවැති දොළොස් වස් කාලපරිච්ඡේදයේ දැරූ අති මහත් දුෂ්කර ව්‍යායාමය මනෝරථපූරණී හෙවත් අංගුත්තරට්ඨකතාවෙහි සඳහන් වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසු ව මෙහි වැඩම කළ අනුබුදු මිහිඳු හිමියන් ප්‍රමුඛ සංඝයා වහන්සේ විසින් ශ්‍රී ලාංකේය ජනතාව වෙත දායාද කරන ලද්දේ මුල් සංගායනා දෙකෙහි දී සම්මත වී, තෙවැනි සංගායනාවේ දී ද අනුමත

වූ අටුවා සහිත ත්‍රිපිටක ධර්මයයි. අරිට්ඨ තෙරුන් වහන්සේ ගෙන් ආරම්භ වූ සිංහල සංඝ පරම්පරාව අනුරාධපුර මහා විහාරය මුල් කරගෙන ස්ථාපිත වූ අතර, ඉන්පසු තවත් වසර 218 ක් පුරා, අරිට්ඨ තෙරුන් ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෝ ථෙරවාද ත්‍රිපිටක ධර්මයත්, අටුවාත්, සම්බුදු සසුනත් ආරක්‍ෂා කරගත්හ.

## ත්‍රිපිටකය රැකගැනීමේ දුෂ්කර ව්‍යායාමය



මේකී දරුණු නියං හා දුර්භික්‍ෂ සමයෙහි සාගින්න හා වෙනත් රෝග පීඩාදීන් හේතුවෙන් ත්‍රිපිටකය කටපාඩමින් දත් ස්වාමීන් වහන්සේලා මිය යනු ඇතැ යි යන භීතිය පැතිරිණි. මෙහි දී ත්‍රිපිටකය ආරක්‍ෂා කරන්නේ කෙසේ ද යන්න උන්වහන්සේලා මුහුණ දුන් මූලික ගැටලුවක් විය. මේ බිහිසුණු වකවානුවෙහි සිය දිවි රැකගැනීමට සිතා ඇතැම් භික්‍ෂූහු ලංකාව අත්හැර මුහුදින් එතෙර වීමට සිතා මුහුදු තෙරට ගියහ. මෙහි දී දිවි රැකගැනීම පමණක් නො ව ත්‍රිපිටක ධර්මය රැකගැනීමේ අවශ්‍යතාව ද මතු වූයෙන් උන්වහන්සේලා අතරින් සැට නමක් ආපසු මලය රටට විත් ගස්වල මුල්, කොළ පමණක් ආහාර වශයෙන් ගනිමින් කටපාඩමින් දත් ත්‍රිපිටක ධර්මය සජ්ඣායනා කරන්නට වූ බවත් ඇතැම් භික්‍ෂූහු දකුණු ඉන්දියාව බලා ගිය බවත් මනෝරථපූරණියට අනුව හෙළි වෙයි.

මහා සාගතයට මුහුණපාමින් වුව ද අසුන් ගැනීමට හැකි තරම් ශරීර ශක්තිය ඇති විට හිඳගෙන සජ්ඣායනා කළ අතර, නොහැකි කල්හි වැලිගොඩවල හිස තබාගෙන සජ්ඣායනා කළ බව පැවැසෙයි. මේ අනුව දොළොස් වසක් අටුවා කතා සහිත ත්‍රිපිටකය ආරක්‍ෂා කළෝ භික්‍ෂූන් වහන්සේලා ය.

දොළොස් වර්ෂ සාගත කාලයෙහි දඹදිවට වැඩ සිටි භික්‍ෂූන් යළි මෙරටට වැඩමවා, මෙහි දුෂ්කර සමය ගෙවූ භික්‍ෂූන් සමඟ .කල්ලගාම. නම් ජනපදයේ මණ්ඩලාරාමයෙහි රැස් වූ බව මනෝරථපූරණියේ ප්‍රථම භාගයෙන් හෙළි වේ. තවමත් කොහි තිබිණි දැ යි හෙළි නො වී පවත්නා මණ්ඩලාරාම විහාරයෙහි මේ භික්‍ෂූන් වහන්සේලා රැස් වූයේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට නො ව ධර්ම විනය සසඳා බැලීමේ අවස්ථාවට යැ යි මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්නයෝ සිය ,ලක්දිව බුදු සසුන හා සිංහල සංස්කෘතිය, නම් කෘතියෙහි සඳහන් කරයි.

ශාසනය නිරුපද්‍රිත ව ඉදිරියට පවත්වාගෙන යෑමට ද, ව්‍යවහාරයේ පවත්නා ධර්ම විනය දෙක බුද්ධ භාෂිතයට එකඟ දැ යි පරීක්‍ෂා කිරීමට ද බුද්ධ වචනය ධාරණායෙන් පවත්වාගෙන යෑමට ද බුද්ධ කාලයේ සිට ක්‍රි.ව. පළමු වැනි සියවස දක්වා සියවස් හතරකට වැඩි කාලයක් කැපවූයේ අපේ මහා සංඝරත්නය ය. උන්වහන්සේලා ධර්මය මෙ සේ පරම්පරාගත ව පවත්වාගෙන ඒම නිසා මේ පාලි පිටක ග්‍රන්ථයන්හි ඇතුළත් සුවිශාල බෞද්ධ සාහිත්‍යයේ විශ්වසනීයත්වයට හානියක් සිදු නො වූ බව මහාචාර්ය එම්. එම්. ජේ. මාරසිංහයන් ගේ ලිපි ලේඛනයන් ගෙන් හෙළි වේ. මුල් බුද්ධ වචනයට වඩාත් සමීප වනුයේ මේ පාලි ත්‍රිපිටක ග්‍රන්ථ සම්ප්‍රදාය බව එතුමා පවසයි.

සියවස් පහකට සමීප කාලයක් මුළුල්ලේ ඉමහත් වෑර වෑයමින් ධාරණයෙන් පවත්වාගෙන ආ ත්‍රිපිටක ධර්මය යනු ඒ සා දීර්ඝ කාලයක දුෂ්කර ප්‍රයත්නයන් ගේ ප්‍රතිඵල වශයෙන් ජාතිය සතු වූ මහාර්ඝ දායාදයකි.

## සද්ධර්මාලෝකය පැතිර වූ ආලෝක ලෙන

මාතලේ පුරවරයට නුදුරින් එහි උතුරු දෙසින් පිහිටි, ඓතිහාසික අලුවිහාරය මෙරට ශාසනික ඉතිහාසයේ සදානුස්මරණීය වූත් පරම පූජනීය වූත් සිද්ධස්ථානයකි. සියවස් පහකට ආසන්න කාලයක් කටපාඩමින් ආරක්ෂා කළා වූ ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ ඓතිහාසික හා අසමසම සිද්ධියට පාදක වූ ප්‍රධාන භූමිය මේ යැ යි සැලැකේ. සද්ධර්මයේ ආලෝකය යම් තැනකින් ලොව පුරා පැතිර ගියේ ද, ඒ ස්ථානය ආලෝක ලෙන, යැ යි 13 වැනි සියවසේ දී පමණ ව්‍යවහාරයට පත් වූයේ ය.

වට්ටගාමිණී අභය හෙවත් වළගම්බා නිරිඳුන් ගේ දෙවැනි රාජ්‍යප්‍රාප්තියට ආසන්න කාලයක එනම් ක්‍රි.ව. පළමු වැනි සියවසේ දී ත්‍රිපිටකය ග්‍රන්ථගත කිරීමේ මෙකී මහා ශාසනික කාර්යාවලිය සිදු වී ඇතැ යි බොහෝ විද්වත්හු නිගමනය කරති. ත්‍රිපිටකය පළමු වැනි සියවසෙහි ග්‍රන්ථාරූඪ වූ බව දීපවංශය හා මහාවංශය ස්ථිර ව පවසන බව සඳහන් කරන මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න, මාතලේ අලුවිහාරයේ ම එය සිදු වූ බව හෙළි වන්නේ 13, 14 සියවස්වල දී යැ යි තවදුරටත් දක්වයි.

දහතුන් වැනි සියවසේ ලියැවුණු පූජාවලිය හෙළි කරන්නේ, මොවුන් (වළගම්බා) දවස පන්සියයක් රහතන් වහන්සේ අලු ලෙන වැඩ හිඳ පොත් සංගායනා කළ සේක, යනුවෙනි. දහ



හතර වැනි සියවසේ ලියැවුණු නිකාය සංග්‍රහය මේ පවත හෙළි කරන්නේ, මුඛපාලි වශයෙන් ගෙන ආ ත්‍රිපිටක ධර්මය එක්තරා ජනපදාධිපතියකු ගේ ආරක්ෂාවෙන් පන්සියයක් මහ රහතුන් වහන්සේ මාතුල නම් දනවුවෙහි අලු ලෙන වැඩ හිඳ පොත් සංගායනා කොට ලියවූ සේක, යන ආදි ලෙසිනි.

පූජනීය අලුවිහාර භූමිය යනු ත්‍රිපිටකය පළමු වරට ලියැවුණු ඓතිහාසික ජයභූමිය බවට කිසිදු සැකයක් නැත. එහි දක්නට ලැබෙන ක්‍රි.පූ යුගයට අයත් බ්‍රාහ්මී ලෙන් ලිපිවලින් මේ විහාරස්ථානයෙහි ඇති පෞරාණිකත්වය වටහාගත හැකි වේ. මෙහි දී ත්‍රිපිටකය ලියා තැබීමෙන් සිදු වූයේ ස්වදේශීය බුදු දහමට පදනම සකස් වීම යි. ලාංකේය සමාජයට හා චින්තනයට ගැළැපෙන පරිදි බුදු දහම ලොව පුරා ව්‍යාප්ත වීමට කරුණු සැලැසුණේ මෙහි සිදු වූ ත්‍රිපිටක ග්‍රන්ථාරූඪකරණයෙන් අනතුරු ව ය.

මෙකී මහා ශාසනික කාර්යය හේතු කොටගෙන උදා වූ ශාසනික ප්‍රබෝධය ඉමහත් ය. තව ද එමඟින් මෙරටට මෙන් ම ලොවට ද උරුම වූයේ පරිපූර්ණ ත්‍රිපිටකයකි. මේ අයුරින් මාතලේ ආලෝක විහාරයෙහි දී ක්‍රි.ව. පළමු සියවසේ දී සිදු වූයේ ධර්මය ක්‍රමවත් ව ග්‍රන්ථාරූඪ කිරීමේ විශිෂ්ට කාර්ය භාරය ය.

ලොව උත්තරීතර ශාස්තෘවරයකු ගේ ධර්මය ක්‍රිස්තු වර්ෂය ආරම්භයෙහි දී ම ග්‍රන්ථාරූඪ කිරීමට සිරිලක මහා සංඝරත්නයට හැකි වීම යනු, භාෂා හා අක්ෂරකරණය අතින් එසමයෙහි අප ලබා සිටි ප්‍රවීණත්වය මතු කාලය පුරාත් ලොව හමුවේ ප්‍රකාශ වීමකි. බුද්ධ ශාසනය ලක්දිව මැනැවින් පිහිටියේ දැ යි දෙවනපෑතිස් රජු මිහිඳු මාහිමියන් ගෙන් විමසූ කල උන්වහන්සේ පවසා ඇත්තේ ,බුදු සසුන පිහිටි නමුත් මුල් බැසගෙන නැතැ යි, යනුවෙනි. බුදුසසුන එ සේ මේ භූමියෙහි මුල් බැසගනුයේ මේ දිවයිනෙහි ම මාපිය දෙදෙනකු ගේ පුතකු මෙහි දී ම විනය උගෙන, මෙරටෙහි දී ම එය විස්තර කොට දේශනා කළ කල්හි යැ යි උන්වහන්සේ මෙහි දී අවධාරණය කළහ.

මෙයින් හෙළිදරවු වනුයේ බුදුදහම විදේශික ආචාර්යවරුන් විසින් ආරක්ෂා කරනු ලැබිය යුතු විදේශික වස්තුවක් සේ තබාගැනීමට ඒ උදාර ධර්මදූතයාණන් අපේක්ෂා නොකළ බව යැ යි මහාචාර්ය පරණවිතානයෝ පවසති. මිහිඳු මාහිමියන් කටයුතු කළේ බුදුදහම ජාතික සංස්ථාවක් බවට පත් කිරීමේ උත්තුංග අරමුණ පෙරදැරි කොටගෙන ය.

## විශිෂ්ට කාලෝචිත තීරණයක්

එ සේ ම බුදුදහම මෙහි පිහිටුවීමෙන් අනතුරු ව බෞද්ධ විහාරාරාම ගොඩනැඟීම, ඒවා දියුණු පවුණු කිරීම, භික්ෂූන් විෂයයෙහි සිවුපසයෙන් උපස්ථාන කිරීම හා සසුනේ ආරක්ෂකයකු ලෙස ක්‍රියා කිරීම සියලු රජ දරුවන් විසින් අනුදක්නා ලදි. එහෙත් වසර 2300 ක් මුළුල්ලේ භික්ෂූන්වහන්සේලා ද, බෞද්ධ ජනතාව ද රජදරුවන් ද දිවි හිමියෙන් සුරැකගත් ථෙරවාද ත්‍රිපිටකය ශ්‍රී ලාංකේය ජාතියේ පරිශුද්ධ උරුමයක් ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත්

කිරීමක් ඉතිහාසයේ කිසිවිට සිදු විණැ යි සිතිය නොහැකි ය. මේ වනාහි මිහිඳු මාහිමියන් අපේක්ෂා කළ බුදුදහම දේශයේ උරුමයක් ජාතික සංස්ථාවක් බවට පත් කිරීමේ චින්තනය වර්තමානය හමුවේ යළිදු යථාර්ථයක් බවට පත් කිරීමට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන් විසින් ගනු ලැබූ විශිෂ්ට කාලෝචිත තීරණයකි.

එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් ශ්‍රී ලංකාව ථෙරවාද බෞද්ධ ධර්මයේ මූලස්ථානය හැටියට පිළිගනු ලැබ ඇති අතර, ඒ සමඟ ම ගරු ජනාධිපතිතුමා, ත්‍රිපිටකය ජාතික උරුමයක් ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කරමින් ඒ උදාර උරුමයට මෙතෙක් නො වූ විරූ නීත්‍යනුකූල භාවයක් හිමි කොට දී ඇත්තේ ය.

මෙමඟින් බුද්ධ වචනයේ හරයට බලපාන විකෘති කරණයන් පිළිබඳ ව හා පිටක ග්‍රන්ථයන්හි දර්ශනයට වෙනස් දේ එක් වී තිබේ දැ යි විමසා බැලීමටත්, ශාසනයේ ආයුෂය ලෙස හැඳින්වෙන විනය පිළිබඳ ව සාවධාන වෙමින් ශාසනය ආරක්ෂා කිරීමටත් අවකාශ සැලැසේ. එක් එක් පෞද්ගලික ආයතන මඟින් ත්‍රිපිටකය මුද්‍රණය කිරීමේ දී විවිධ විකෘතීන්ට හා වෙනස්කම්වලට භාජනය වීම නොවැළැක්විය හැකි ය. එහෙත් ත්‍රිපිටකය ජාතික උරුමයක් සේ ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරු ව එහි සියලු ප්‍රකාශන හිමිකම් බුද්ධ ශාසන අමාත්‍යාංශය සතු වනු ඇත.

## ධර්මානුගත ජීවිතාදර්ශය

ස්වකීය ආගමික ශාසනික හා සමාජීය මෙහෙවර ඉටු කරන සංඝ පිතෘන් වහන්සේලා ඇතුළු මහ සඟන ගේ විහරණයට සුව එළවන විහාරාංගයන් නිමවාලමින්, පිරිවෙන් ගොඩනංවමින්,



ඒවායේ දියුණුව සලසමින්, දහම් පාසල් ගොඩනැඟිලි, ධර්මශාලා, දානශාලා, සංඝාවාස සහිත තනිමහල්, දෙමහල් නව ගොඩනැඟිලි තනමින් මහා සංඝරත්නය මතු නො ව අන්‍ය ආගමික පූජකවරුනට ද හිතසුව සලසන ජීවන පරිසරයක් සාදාලීමට පසුගිය වසර තුනහමාරක කාලය තුළ ගරු ජනාධිපතිතුමා ගේ පුරෝගාමිත්වයෙන් සිදු වූ කාර්ය භාරය සුවිසල් ය.

දානය, ශීලය, පරිත්‍යාගය ස්වකීය චර්යාවෙන් ම ප්‍රකට කළ ගරු ජනාධිපතිතුමා අවෛරයෙන් ම වෛරය පිටුදැකීමේ ආදර්ශය, රාජ්‍ය නායකත්වයට පත්වීමට පෙරාතුවත්, ඉන් පසුවත් ශ්‍රී ලාංකේය සමාජය හමුවේ පළ කොට ඇත. එතුමා ධම්මො හවේ රක්ඛති ධම්මචාරී, යන ධර්මයෙහි තමා පිහිටා සිටින බවත්, එනිසා ම උවදුරු විරහිත ජීවිතයක් තමාට මේ තාක් උරුම වී ඇති බවත් ඍජු ව ප්‍රකාශ කළ නායකයෙකි. එබඳු ධර්මානුගත ප්‍රතිපත්තියක නොපිහිටියේ නම් එවැනි ප්‍රකාශයක් අතිශය හිස්, ව්‍යාජ ප්‍රකාශයක් වෙයි. එවන් ජනනායකයකු විසින් ම ථෙරවාද ත්‍රිපිටකය ජාතික උරුමයක්

ලෙස නිල වශයෙන් ප්‍රකාශ කරනු ලැබීම යනු එකී ත්‍රිපිටකාගත උරුමයට ද නිසි ගෞරවය ලබාදීමකි.

ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනයන් සතු ගුණාංග පූර්ණ ජීවිතය වටහා ගැනීමට දේශපාලනික මතවාද සමඟින් බෙදී වියවුල් වූ සමාජයකට අපහසු වුව ද, ස්වාධීන ව නුවණින් විමසන්නකුට එතුමා සතු අචල අනුකම්පක ස්වභාවය වටහාගත හැකි වනු ඇත. තමා නසනු පිණිස එන කෙනකුන් කෙරේ වුව ද දයා පරවශ ලෙස කටයුතු කළ හැකි බව එතුමා ක්‍රියාවෙන් ම පළ කොට ඇත.
ත්‍රිපිටකය ජාතික උරුමයක් ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීම නමැති මේ නවමු සිතිවිල්ල ගරුතර මහා සංඝරත්නයේ උපදෙස් හා අනුශාසනා පරිදි ගරු ජනාධිපතිතුමා ගේ ම අධ්‍යාත්මයෙන් පැන නැඟි ක්‍රියාත්මක වූවකි. නිවට ව නියාලු ව පරදේශීන් ගේ යටත් වැසියන් සේ හිඳිනු වෙනුවට ස්වකීය නිදහස වෙනුවෙන් නැඟී සිටි 1818 කැරැල්ලේ විරුවන් එවක අධිරාජ්‍යවාදී පාලකයන් විසින් රාජද්‍රෝහීන් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. එකී නාමකරණයෙන් හෙළ විරුවන් ගේ නාමයන් නිදහස් කොට, ඔවුන් අව්‍යාජ වීරවරයන් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු ය යන්න නිදහසින් පසු පවා මෙරට සියලු පාලකයන් ගේ අවධානයට හසු නොවිණි.

1818 ඌව - වෙල්ලස්ස අරගලයට සහභාගි වූ රණශූර කැප්පෙටිපොළ නිලමෙතුමා ඇතුළු සියලු විරුවන් ශ්‍රේෂ්ඨ ජාතික වීරවරයන් ලෙස ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථම කොට කටයුතු කරන ලද්දේ ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් බව අප මේ අවස්ථාවෙහි ද සිහිපත් කළ යුතු ය. ඒ 1818 කැරැල්ලට පුරා වසර 200 ක් සපිරීම නිමිති කොට ගෙන ය.

## සංඝරත්නයේ අප්‍රමාණ කැපවීම

අද එක් මොහොතකින් පරිගණකයෙන් හෝ ජංගම දුරකථනයෙන් ත්‍රිපිටක ධර්මයේ තමාට ඇවැසි දහම් කොටසක් පරිශීලනය කිරීමට වර්තමාන ශ්‍රී ලාංකේය බෞද්ධ සමාජයට මෙන් ම ලෝකවාසීන්ට ද හැකි ව ඇත්තේ, බුදුන්වහන්සේ ජීවමාන කාලයෙහි සිට ක්‍රි.ව. 1 වැනි සියවස දක්වා වූ මහා සංඝරත්නය විසින් බුද්ධභාෂිතය ස්මෘතියෙන් හෙවත් මතකයෙන් දරා සිටිමින් කළ අප්‍රමාණ කැපකිරීම් හේතු කොටගෙන ය. මේ පිළිබඳ අතිමහත් ගෞරව බහුමානපූර්වක හැඟීමක් ඇති කරගත හැක්කේ සියවස් පහකට නොවැඩි කාලවකවානුවක් මනුෂ්‍ය සමාජය විසින් ම ත්‍රිපිටක ධර්මයේ පැවැත්ම පිණිස දරනු ලැබූ අප්‍රමාණ ප්‍රයත්නය පිළිබඳ ප්‍රත්‍යක්ෂපූර්ණ හැඟීමක් ඇත්තකුට පමණි. ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන් ඒ පිළිබඳ ප්‍රශස්ත වැටැහීමකින් ත්‍රිපිටකය ජාතික උරුමයක් ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කරනුයේ බුද්ධභාෂිතය පිළිබඳ අප්‍රමාණ ගෞරවාදරයෙන් මෙන් ම ශ්‍රී ලාංකිකයන් ගේ ජීවිත ද ත්‍රිපිටක ධර්මයේ ආලෝකයෙන් බැබැළේ වා යි යන අපේක්ෂාව පෙරදැරි ව ය.

අද දින ජාතික උරුමයක් සේ නිල වශයෙන් ප්‍රකාශයට පත් වන ථෙරවාද ත්‍රිපිටක ධර්මයේ ආලෝකය ඔබේ දිවි මඟ ප්‍රභාවත් කිරීමට මතු මතුත් හේතු වාසනා වේවා යි ප්‍රාර්ථනය කරමු.

"සුඛො බුද්ධානං උප්පාදො<br>සුඛා සද්ධම්මදෙසනා<br>සුඛා සංඝස්ස සාමග්ගී<br>සමග්ගානං තපො සුඛො"

# தேசிய மரபுரிமையாக பிரகடனப்படுத்தப்பட்டுள்ள திரிபிடகம்

## திரிபிடகம் பற்றிய அறிமுகம்

தேரவாத பௌத்த பாரம்பரியத்தின் மூல நூலாக கருதப்படுவது பாளி மொழியில் எழுதப்பட்டுள்ள திரிபிடகம் ஆகும். பாளி மொழியில் திரிபிடகம் என்பதற்கு மூன்று கூடை அதாவது மூன்று வகுப்பு என்பது பொருள். அவை சுத்த பீடகம் (பேருரைப்பகுதி), அபிதம்ம பீடகம் (உன்னத கோட்பாட்டுப் பகுதி) மற்றும் விநய பீடகம் (நன்னடத்தைக் கோட்பாட்டுப் பகுதி) என்பனவாகும். பீடகத்தைப் பிடக்கு என்று தேவாரம் கூறுகிறது. புத்த பெருமான் தம் கொள்கைகளை போதித்து வந்த போதிலும், அவர் அக்கொள்கைகளை நூல் வடிவமாக எழுதி வைக்கவில்லை. ஆனால், அவருடைய சீடர்கள், அவருடைய போதனைகளை இரண்டு சங்ஹிதை (தொகுப்பு) களாகத் தொகுத்துப் பாராயணம் செய்துவந்தனர்.

## முதலாவது சங்க பேரவை

புத்த பெருமான் பரிநிப்பானம் (மறைவு) அடைந்த சில மாதங்களுக்குப் பின்னர், சத்தபணி என்னும் மலைக் குகையிலே ஐந்நூறு தேரர்கள் ஒன்றுகூடினார்கள். இதுவே பிக்கு சங்கத்தினர் கூடிய முதல் மாநாடு ஆகும். இந்த முதல் சங்கத்திலேயே விநயபீடகம், தம்ம (அபிதம்ம) பீடகம் என்னும் இரண்டு பீடகங்கள் மட்டுமே தொகுக்கப்பட்டன. (சூத்திர பீடகம் என்னும் மூன்றாவது பீடகம், அபிதம்ம பீடகத்திலிருந்து பிற்காலத்தில் பிரித்துத் தொகுக்கப்பட்டது.) இவ்வாறு ஆதியில் இரண்டு பீடகங்களாக இருந்தவை பிற்காலத்திலே, மூன்று பீடகங்களாகத் தொகுக்கப்பட்டன. ஆகவே, முதலில் கூறியபடி இவற்றிற்குத் திரிபிடகம் என்று பெயர் உண்டாயிற்று.



திரிபிடக தொகுக்கப்பட்ட பிறகும், அது எழுதாமறையாகவே இருந்தது. பீடகங்களைப் பிக்குகள் நாள்தோறும் ஓதி, பாராயணம் செய்து வந்ததோடு அவற்றைத் தன் சீடர்களான பிக்குகளுக்கும் கற்பித்து ஓதுவித்து வந்தனர். இவ்வாறு, புத்தருடைய அருள் வாக்குகள், எழுதப்படாமல் எழுதாமறையாக இருந்து, ஆசிரிய மாணவர் வழிமுறையாக நெடுங்காலம் ஓதப்பட்டன. விநயபீடகத்தை ஓதிய பிக்குகள் விநயதரர் என்றும், சூத்திரபீடகத்தை ஓதிவந்தவர் சூத்ராந்திகர் என்றும், அபிதம்மபீடகத்தை ஓதிவந்தவர் அபிதம்மிகர் என்றும் பெயர் வழங்கப்பட்டனர். இவ்வாறு திரிபிடகத்தை பாராயணம் செய்துவந்த பிக்குகளுக்குப் பாணகர் என்பது பெயர். தீக பாணகர், மஜ்ஜிம பாணகர், சம்யுத்த பாணகர், அங்குத்தர பாணகர், ஜாதக பாணகர், தம்மபதப் பாணகர் முதலிய பெயர்களைப் பௌத்த மத உரை நூல்களில் காணலாம்.

## இலங்கையில் தேரவாத பௌத்தமும் திரிபிடகம் நூலுருப்படுத்தப்படலும்

இலங்கைத் தீவிலே, கி.மு. மூன்றாம் நூற்றாண்டு முதல் நான்காம் நூற்றாண்டு வரையில், பழைய தேரவாத பௌத்தம் நிலைபெற்றுள்ளது. இங்கும் கி.மு முதல் நூற்றாண்டிலே புதிய கொள்கைகள் பௌத்த மதத்தில் புகத் தொடங்கின. ஆகவே, தேரவாத பௌத்த பிக்குகள் ஒன்றுகூடி, ஆதிக்கொள்கைக்குப் புறம்பான

புதிய கொள்கைகள் திரிபிடகவில் நுழையாதபடி போற்றவேண்டும் என்னும் கருத்தோடு, அதுவரையும் எழுதாமறையாக இருந்த திரிபிடகத்தை நூல் வடிவமாக எழுதினார்கள்.

இலங்கைத் தீவை கி.மு 29 முதல் 17 வரையில் அரசாண்ட வட்ட காமினி அபயன் என்னும் வலகம்பா அரசன் காலத்தில் திரிபிடகம் முதன் முதலில் நூல் வடிவமாக எழுதப்பட்டது என்று மகா வம்சம் கூறுகிறது. இலங்கையின் மலைநாட்டிலே, வரலாற்று முக்கியத்துவம் வாய்ந்த மாத்தளைக்கு அண்மையிலிருந்த ஆலோக (அலு) விகாரை என்னும் பௌத்த விகாரையில் திரிபிடக பொற்றகட்டில் எழுதப்பட்டு அவ்விகாரையில் ஒரு கற்பாறையின் கீழ் சேமித்து வைக்கப்பட்டதென்று கூறப்படுகிறது.

இவ்விகாரையில் காணப்படும் கிறிஸ்துவுக்கு முற்பட்ட காலத்திற்குரிய பிராஹ்மி ஆவணங்களில் இருந்து இந்த விகாரையின் தொன்மையை புரிந்துகொள்ள முடியும். இங்கு எழுதப்பட்ட திரிபிடகத்தின் மூலம் சுதேச பௌத்த சமயத்திற்கு ஒரு அடிப்படை கிடைக்கப் பெற்றதோடு, இலங்கை சமூகத்தின் சிந்தனைக்கு பொருத்தமான வகையில் பௌத்த சமயம் உலகெங்கிலும் பரவுவதற்கும் காரணமானது. உலகின் ஒரு உன்னதமான சமய நூலை கிறிஸ்து வருட ஆரம்பத்திலேயே நூல் வடிவத்திற்கு கொண்டு வந்ததன் மூலம் மொழி மற்றும் எழுத்தறிவில் இலங்கையர்களான நாம் அடைந்திருந்த முன்னேற்றம் பற்றி உலகிற்கு எடுத்துக்கூறுவதற்கு இது சான்றாக விளங்குகின்றது.

## காலத்துக்கு ஏற்ற உன்னத தீர்மானம்

பௌத்த மதம் இங்கு நிலைபெற்றதைத் தொடர்ந்து பௌத்த விகாரைகள் கட்டியெழுப்பப்பட்டமை, மேம்படுத்தப்பட்டமை, உள்நாட்டிலேயே பிக்குகள் சமயத்தை கற்றுத் தேர்ந்தமை, அரச தலைவர்களினால் சாசனம் பாதுகாக்கப்பட்டமை போன்ற நிகழ்வுகள் வரலாறு நெடுகிலும் இடம்பெற்று வந்ததுடன் அவை பௌத்த சமய எழுச்சியில் பெரும் பங்காற்றின. எனினும் சுமார் 2300 வருடகால இந்த பாரம்பரியத்தில் உயிரெனப் பாதுகாக்கப்பட்ட தேரவாத திரிபிடகத்தை

இலங்கை தேசத்தின் புனித மரபுரிமையாக பிரகடனப்படுத்தும் நிகழ்வு வரலாற்றில் ஒருபோதும் இடம்பெறவில்லை. மஹிந்த தேரரின் எதிர்பார்ப்பாகவிருந்த பௌத்த சமயத்தை தேசத்தின் மரபுரிமையாக ஆக்கும் கனவை நனவாக்கும் வகையில் திரிபிடகத்தை தேசிய மரபுரிமையாக பிரகடனப்படுத்துவதற்கு மேன்மைதங்கிய ஜனாதிபதி மைத்ரிபால சிறிசேன அவர்கள் எடுத்த தீர்மானம் காலத்திற்கேற்ற ஒரு உன்னத தீர்மானம் என்பதில் சந்தேகமில்லை. திரிபிடகத்தை தேசிய மரபுரிமையாக பிரகடனப்படுத்தும் தீர்மானத்திற்கு கடந்த 2018 செப்டெம்பர் 18 ஆம் திகதி அமைச்சரவை அங்கீகாரம் வழங்கியது.

இலங்கை ஐக்கிய நாடுகள் சபையினால் தேரவாத பௌத்த சமயத்தின் தாயகமாக ஏற்றுக் கொள்ளப்பட்டுள்ள நிலையில், திரிபிடகத்தை தேசிய மரபுரிமையாக உத்தியோகபூர்வமாக பிரகடனப்படுத்துவதன் ஊடாக மேன்மைதங்கிய ஜனாதிபதி அவர்கள் அந்த உன்னத மரபுரிமைக்கு இதுவரை கிடைத்திராத சட்ட அந்தஸ்த்தை பெற்றுக்கொடுத்துள்ளார். திரிபிடகம் தேசிய மரபுரிமையாக பிரகடனப்படுத்தப்பட்டுள்ளதன் மூலம் அதன் முழுமையான வெளியீட்டு உரிமை புத்த சாசன அமைச்சை சார்ந்துள்ளது.

## தர்மத்தை கொள்கையாக வகுத்துக்கொண்ட தலைவர்

சமய, சமூக பணிகளை மேற்கொண்டு விகாரைகள் பிரிவெனாக்களை கட்டியெழுப்பி, அவற்றின் முன்னேற்றத்திற்காக நடவடிக்கைகளை மேற்கொண்டு, அறநெறி பாடசாலை கட்டிடங்கள், சமய உரை மண்டபங்கள், மகா சங்கத்தினருக்கான தங்குமிடங்கள் மட்டுமன்றி ஏனைய சமயத் தலைவர்களுக்கான சிறந்த வாழ்க்கைச் சூழலை அமைத்துக்கொடுப்பதற்கும் கடந்த மூன்றரை வருடக் காலப்பகுதியில் ஜனாதிபதி கௌரவ மைத்ரிபால சிறிசேன அவர்கள் மேற்கொண்ட முற்போக்கான பணிகள் பாராட்டத்தக்கவையாகும்.

கொடை, தாராளத்தன்மை, தியாகம் ஆகிய சிறந்த பண்புகளைக்கொண்ட ஜனாதிபதி அவர்கள், இலங்கை

சமூகத்தில் சிறந்த முன்மாதிரிமிக்க தலைவராக திகழ்கின்றார். "தம்மோ ஹவே ரக்கதி தம்மசாரிங்" "தர்மத்தில் ஈடுபடுபவனை கண்டிப்பாக தர்மம் பாதுகாக்கும்" என்ற அறப் போதனையை தான் பின்பற்றி நடப்பதாகவும், எனவே தனக்கு ஆபத்துக்கள் இல்லாத வாழ்க்கை கிடைக்கப்பெற்றிருப்பதாகவும் வெளிப்படையாக தெரிவிக்கின்ற ஒரு தலைவராக அவர் இருக்கின்றார். இத்தகைய பண்புகளை கொள்கையாக வகுத்துக்கொண்டிருக்காவிட்டால் அவை வெறும் வெற்று வார்த்தைகளாகவே இருந்திருக்கும். இத்தகைய உயர்ந்த மக்கள் தலைவரினால் தேரவாத, திரிபிடகத்தை தேசிய மரபுரிமையாக பிரகடனப்படுத்தப்படுவது அந்த மரபுரிமைக்கு வழங்கப்பட்ட உயர்ந்த கௌரவமாகும்.
ஜனாதிபதி அவர்களிடமுள்ள உயர்ந்த வாழ்க்கை பண்பாடுகளை அரசியல் கருத்து வேறுபாடுகளினால் விலகி நிற்கும் ஒரு சமூகத்தினால் புரிந்துகொள்வது கடினம் என்றபோதும் சுயாதீனமாகவும் அறிவுபூர்வமாகவும் சிந்திக்கின்ற ஒருவர் அவரை சிறந்த முறையில் விளங்கிக்கொள்ள முடியும். தன்னை கொலை செய்ய வந்த ஒருவருக்கும் அவர் மன்னிப்பை வழங்கி இருக்கிறார்.

திரிபிடகத்தை தேசிய மரபுரிமையாக பிரகடனப்படுத்த வேண்டுமென்பது ஜனாதிபதி அவர்களின் உள்ளத்தில் இருந்து எழுந்த ஒரு செயற்பாடாகும். 1818ஆம் ஆண்டு ஊவா வெல்லஸ்ஸ போராட்டத்தில் பங்குபற்றிய வீரர்களை ஏகாதிபத்திய ஆட்சியாளர்கள் தேசத் துரோகிகளாக பிரகடனப்படுத்தியிருந்தனர். அப்போராட்டத்தில் பங்கெடுத்த வீர கெப்பட்டிபொல உள்ளிட்ட அனைத்து வீரர்களையும் தேசத் துரோக குற்றச்சாட்டுக்களில் இருந்து விடுவித்து சிரேஷ்ட தேசிய வீரர்களாக பிரகடனப்படுத்த நடவடிக்கை எடுத்தவர் ஜனாதிபதி கௌரவ மைத்ரிபால சிறிசேன அவர்களே என்பதையும் ஊவா வெல்லஸ்ஸ போராட்டத்திற்கு 200 வருடங்கள் நிறைவடையும் இச்சந்தர்ப்பத்தில் நாம் மறந்துவிட முடியாது.

இன்றைய தினம் தேசிய மரபுரிமையாக உத்தியோகபூர்வமாக பிரகடனப்படுத்தப்படும் இந்த தேறவாத, திரிபிடகத்தின் ஒளியில் எம் அனைவருடையவும் வாழ்க்கை வளம்பெற வேண்டுமென பிரார்த்திப்போம்.

## Tipitaka Dharma, a national heritage

The Pali Tipitaka volumes considered as the foundation source of the Sri Lankan Buddhist tradition. Tipitaka Dharma constitutes of the Sutra Pitaka, Vinaya Pitaka, and the Abhidharma Pitaka as well as it includes the Atthakatha and Teeka.



This is the most prominent sacred heritage in the world history which was brought forward for generations by listening to verbal recitation and memorizing. Since the first Dhamma Sangayana to the transcription of the Tipitaka at the Matale Alu Viharaya in 1st Century A.D, the Maha Theros and their student generation preserved this Dharma through oral form.

The Buddha's teachings were divided into nine parts during his lifetime and during the first Dhamma Sangayana it was divided into three parts as Sutra Pitaka, Vinaya Pitaka, and the Abhidharma Pitaka. The Dhamma preached by the Buddha over the 45 years was preached by 500 bhikkhus jointly by memorizing those teachings, at this first Dhamma Sangayana. Since then the great responsibility of preserving this Vinaya Pitaka for the benefit of the Sasanaya was vested on Ven. Upali Maha Thero and his student generation.

***Bhanaka Theravaru***

The Sutra and the Abhidharma Pitaka also, since the first Dhamma Sangayana, handed over to each respective generation. The bhikkhus who were vested with the responsibility of continuation and

preservation of each part of the Tripitaka was named as 'Bhanaka'. Accordingly, Bhanaka Theravaru was titled as Diga, Majjima, Sanyuktha, Anguththara, Dhammapada and Maha Ariyawansha and in ancient Sinhala stone inscriptions (Shilalipi) they were named as majimabanaka, Sayunabanaka, Utharabanaka and Pelabanaka.

The responsibility of a Bhanaka is to carry forward the Dhamma from generation to generation. The well experienced and intelligent monk will achieve the status of Bhanaka for the section of the Tipitika, which he can memorize in a more sustainable manner. Accordingly, the monk who learns the first 50 Suthra of Majjima Nikaya will be called as Majjima Bhanaka while the monk who knows the Jataka tales, Atuas and Dhammapada by remembrance were called Jataka Bhanaka.

The education system of the bhikkhus of Anuradhapura Maha Viharaya was also to capture the Dharma explained by the educator by listening as well as to preserve it for generations. We feel pride when taking into the consideration regarding the manner in which the bhikkhus of the Maha Vihara preserve this Tipitaka Dharma to continuously maintain the preservation of Budda Bashitaya, the most complicated efforts taken by bhikkhus of the Maha Vihara was mentioned in the Anguttarakatawa.

Anubudhu Mihindu Maha Thero who visited here 236 years after the Mahaparinirwana of Buddha and other members of Mahasangha presented to the Sri Lankan people the Tripitaka Dharma with Atuwa, which was accepted by the first two Sangayanawa or Buddhist Councils and approved in the third Sangayanawa. The Sinhala Sangha generation originated from Aritta Thero was established centering the Anuradhapura Maha Viharaya, and for more than 218 years, the student generation of the Aritta Thero preserved the Theravada Tipitaka Dharma, Atuwa and Sambudu Sasuna.

## *The robust effort of preserving the Tipitaka*

There was a fear that the erudite Theros who knew the Tripitaka by memory might disappear due to the period of devastating catastrophe or during droughts and various diseases. The fundamental issue faced by them was how to preserve the Tripitaka. Some monks in this calamitous situation with the aim of protecting their lives went to the sea to travel overseas. According to the Manorathapuraniya, 60 monks travelled to Malay Rata with



the aim of preserving the Tipitaka Dharma by saving their lives. They survived by eating the roots and leaves of the trees as there was no food. Some monks travelled to South India for the same purpose.

Even though, facing starvation during the famine, they preached the Tripitaka by sitting down, when they did not have strength to stand, and when they were not able to sit, they simply lie down to stay alive to fulfill their task. Accordingly, the bhikkhus preserved the Tripitaka with Atuwa for nearly 12 years, facing untold miseries.

The first part of the Manoratapuraniya revealed that the bhikkhus who visited Dambadiva during the famine period of 12 years after returning to the country joined with the bhikkhus who lived in the country during the difficult period, at the Mandalaramaya in 'Kallagama' village. Prof. Anuradha Seneviratne in his book titled' Lakdiva Budu Sasuna ha Sinhala Sanskruthiya' mentioned that these bhikkhus gathered at the Mandalarama Viharaya not to

transcribe the Tripitaka but to compare the Dharma Vinaya. Over four decades, since the Buddhist era to 1st century AD, our Maha Sangha committed to continuously take forward the Sasanaya without any destruction, to scrutinize whether the Dhamma Vinaya in practical life inconsistent with the Buddha's sermons and teachings. According to the articles of Prof. M.M.J. Marasinghe it was exposed that the trust placed on the vast Buddhist literature included in the Pali Pitaka books, was not damaged because those bhikkhus took this forward from generation to generation. He further said that initial words of the Buddha closer to this tradition of Pali Tripitaka books.

The Tripitaka Dharma which was brought forward with a great commitment, is a great inheritance for the people.

The Aloka lena (cave with light) which spread the Saddharmalokaya The historic Aluviharaya cave temple close to Matale, is a most sacred eternal religious place. This is the central place where the historic as well as incomparable incident of transcribing of Tripitak Dharmaya , which had come down by mere word of mouth by being committed to memory by Buddhist monks of the time, took place. In the 13th century, it was said that ‘If from a certain place the light of the Saddharmaya spread to the world, that place is the Aloka lena (cave with light).’

The Tripitaka were written during the rule of king Walagamba or Wattagamini Abhaya.

Prof. Anuradha Seneviratne states that Deepavansa and Mahavansa say that the 'Tripitakaya' was written in the first century AD. It is said that it was in Matale Aluvihare temple in the 13th and 14th centuries.

Written by in the thirteenth century, the Poojawaliya reveals that "In the days of the king of Walagambha, the Dhamma was recited by



500 Arahats". This revelation of the 14th Century Edition reveals this: "The Tripitaka volume, brought by the word of mouth was written at the Aluvihara Temple and compiled books in the city of Mathula by five hundred Buddhist Arahats.

There is no doubt that the sacred site of Aluvihara Temple is the original Tripitakaya written for the first time. It can be traced back to Brahmi cave scriptures in ancient times. History of this temple can be understood from the Brahmi cave scriptures of ancient times. Writing Tripitakaya scripts created the foundation of the native Buddhism. It was in keeping with Sri Lankan society and thinking that Buddhism was an all-encompassing phenomenon all over the world.

The writing of Tripitaka served immensely for preservation and propagation of the Buddhist Sasana. It also provided the perfect epithet for the country and the world. In the light of this, in the first century AD, the activities of the Matale Aluvihara Temple served excellently for the practice of the Dhamma.

When the King of Dewanapathis inquired from Mihindu Thera about whether the Buddha Sasana was in good shape, he has said, "Buddha Sasana is not rooted". The Buddha Sasana took the roots

of this land to the ground, teaching the prelate that he was teaching his son at this same island and describing it in the same way and preaching it.

This reveals that great harbinger of Buddhism did not at least expect Buddhism to be a treasure that should be secured by the foreign erudite, says Prof. Paranavithana. Mihindu Thero was working on with a purpose to make Buddhism a national institution.

### *An excellent timely decision*

Thus after Buddhism was established likewise, building Buddhist temples, developing them, providing hospitality to the Bhikkus with "Sivupasa" and working as a guardian of the Buddhist order was often looked forward by all the kings. In these circumstances, the Theravada Tripitakaya, which was secured and preserved for 2300 years by the Bhikkus, the Buddhists, and the kings sacrificing their lives, was officially announced as a pure heritage of the Sri Lankan nation is indeed an historic occasion.

This is indeed a timely decision taken by President Maithripala Sirisena for the sake of securing the heritage of Buddhism which was introduced by Mihndu Thero to be announced as a national heritage.

The United Nation Organization has accepted Sri Lanka as the centre of Theravada Buddhism and with President Maitripala Sirisena proclaiming the Tripitakaya as a national heritage is a proud moment to the entire nation.

The inscription of Tripitaka has guarded against the irrational connotations which influence the meaning of the Buddha's words and weather things are added differently to the philosophy of the Pitaka books and code f discipline that preserved the dhamma and the Buddhist order. It is inevitable that printing the Thripitakaya from

different private institutions is abridged to different sorts of irrational connotations and differences. Once the Tripitaka is proclaimed as the national heritage, the rights of publication of Tripitaka will be under the Ministry of Buddha Sasana.

### *Philosophy of Religious Life*

The contribution made by President Sirisena during the past three and a half years to develop Buddhist education by providing assistance to develop Dhaham Pasal, providing new buildings for Dhamma Shala, Dhana Shala, Sanghawasa, construction of several single floor and two floor new buildings towards establishing an environment that provides comforts to the Mahasanga and other religious leaders was paramount.


President Sirisena, a person who always displayed the virtues of giving, and generosity and self discipline as well as merits of eradicating hatred through kindness throughout his own career, before and after becoming the Head of State. He is a leader who has shown that he is true practitioner of the preaching, "Dhammo Bhave Rakkathi Dhammachari" and that he has publicly stated that thus far he was fortunate that no evil force could harm him. If he had not adhered to those principles genuinely he could not have made such a bold statement and it would have been an empty, vain statement. Hence, such a leader declaring the Theravada Tripitakaya as a National Heritage is the most appropriate respect to the heritage of Tripitaka itself.

Understanding the life of President Maithripala Sirisena filled with virtues is difficult for a society with divided beliefs in politics. Yet an independent observer will be able to understand his firm sympathetic nature. He has proved through his actions that he can show sympathy even towards a bitter enemy who comes to destroy him.

The ardent desire to officially pronounce Tripitaka as a national heritage is a spiritual awakening of President Maithripala Sirisena himself and that came in to action with blessings, advice and instructions and guidance of the Mahasangha.

Another instance of his ardent desire to give due placement for national heritage was his declaration of 1818 Uva Wellassa rebellion leaders as National Heroes. President named Veera Keppitipola Nilame and other rebellion leaders as National Heroes on the occasion of the 200th anniversary of the rebellion.

### *Massive Contribution of Mahasangha*



Today the whole world and the whole nation have the opportunity to instantly refer to any part of Dhamma that they want to hear through computers or mobile phones due to the major contributions made by the Mahasangha who preserved the dhamma through ages by memorizing the teachings of the Buddha from the time of the Buddha until the sixth Century. The unique greatness of the endeavour could genuinely felt by a person with a clear perception of the major efforts and sacrifices made by the Bikkus for five decades to finally convert the Tripitaka Dhamma into writing ola leaves. President Maithripala Sirisena, who holds a precise understanding of this hazardous task as a devoted Buddhist, will pronounces officially the Tripitaka as a national heritage treasure with great dignity and respect towards the Buddha Bhashitha.

May the light officially spread by the announcement of Tripitaka as a national heritage become the light of fortune for glorifying your life and your future!

*"Sukho Buddhanam Uppado*
*Sukha Sahddhammadesana*
*Sukha Sanghassa Samaggi*
*Samaggahang Thapo Sukho"*

REFERENCE



ජනාධිපති කාර්යාලයේ
පුස්තකාලය



# ත්‍රිපිටක ධර්ම දායාදය

ජාතික උරුමයක් වූ වගයි

pmd
President's Media Division
ජනාධිපති මාධ්‍ය අංශය
2019 - 01 - 05
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.